**15**

# සූරා අල් කද්ර්

سُورَةُ الْقَدْرِ مَكِّيَّةٌ وَهِيَ خَمْسُ آيَاتٍ

بِسْمِ اللَّهِ الرَّحْمَٰنِ الرَّحِيمِ ○

إِنَّا أَنزَلْنَاهُ فِي لَيْلَةِ الْقَدْرِ ﴿١﴾ وَمَا أَدْرَاكَ مَا لَيْلَةُ الْقَدْرِ ﴿٢﴾ لَيْلَةُ
الْقَدْرِ خَيْرٌ مِّنْ أَلْفِ شَهْرٍ ﴿٣﴾ تَنَزَّلُ الْمَلَائِكَةُ وَالرُّوحُ فِيهَا
بِإِذْنِ رَبِّهِم مِّن كُلِّ أَمْرٍ ﴿٤﴾ سَلَامٌ هِيَ حَتَّىٰ مَطْلَعِ الْفَجْرِ ﴿٥﴾

සූරා අල් කද්ර් අල් කුර්ආනයේ 97වන පරිච්ඡේදයයි. මෙය පහළ කරනු ලැබුවේ නබි සල්ලල්ලාහු අලයිහි වසල්ලම් තුමාගේ මක්කා ජීවිත කාල වකවානුව තුළ නිසා මෙය මක්කී සූරාවකි. ආයත් පහකින් යුක්ත මෙම සූරාව කිසි යම් කරුණක් පිළිබඳ අදහස ඉදිරිපත් කරන කුඩා සූරාවකි.

මේ සූරාවේ අදහස පහත දැක්වේ.

1. සැබවින්ම අපි මෙම අල් කුර්ආනය (ඉතාමත් උතුම් වූ) ලයිලතුල් කද්ර් යන රාත්‍රියක දී පහළ කළෙමු.

2. නබිතුමනි, මෙම උතුම් වූ රාත්‍රියේ වැදගත්කම ඔබ දන්නවා ද?

3. උතුම් වූ මෙම රාත්‍රිය දහසක් රාත්‍රීන්ට වඩා උසස් ය.

4. එහි මලාඉකාවරු (ජිබ්රීල් ආදීය) රූහ් ද තම දෙවියන්ගේ අණ පරිදි (සිදුවිය යුතු ) සියලු ම කටයුතු සමඟ පහළ වෙති.

5. විමුක්තිය ඇති වේවා. (මෙම රාත්‍රියේ සුවිශේෂත්වය) උදෑසන තෙක්. (පවතින්නේය.)

මෙහි දී කරුණු දෙකක් ඉදිරිපත් කරන්නේ ය.

(i) අල් කුර්ආනය ලයිලතුල් කද්ර් යන රාත්‍රියේ පහළ කරනු ලැබීම
(ii) ලයිලතුල් කද්ර් යන රාත්‍රියේ වැදගත්කම

ප්‍රථම අදහස සූරා බකරාවේ පහත වැකියෙන් පැහැදිලි කෙරෙන්නේ ය.

"රමළාන් මාසය කොතරම් පාරිශුද්ධ ද යත් ඍජු මාර්ගය පෙන්වන අල්කුර්ආනය (ආගම) පහළ කරනු ලැබූයේ එම මාසයේ දී ය. එය (යහපත හා අයහපත වෙන්කොට දක්වා ඍජු මාර්ගය පැහැදිලි කළ හැකි වැකි ඇතුළත් එකක් ද වන්නේ ය." (2: 185) දෙවන අදහස පළමු අදහස හා එක්කොට සූරා අද් දුහාන් සමඟ පහත සූරාව පෙන්වා දෙයි.

"හාමීම්, පැහැදිලි මෙම ආගම මත දිවුරා සැබවින් ම මෙය ඉතාමත් භාග්‍යවන්ත වූ (ලයිලතුල් කද්ර් යන) එක් රාත්‍රියක් (ප්‍රථම වතාවට) පහළ කරනු ලැබ සැබවින් ම අප (මේ මගින් බිය ගන්වා අවවාද කරන්නෙමු. සැබවින් ම සියලු කටයුතු අපගේ අණ පරිදි (තීරණය කර) බෙදා දක්වනු ලබන්නේ එහි දී ය."(44 : 1-4)

"ලයිලතුල් කද්ර්" යන රාත්‍රිය කවර රාත්‍රියක් පෙන්වා දෙන්නේ දැයි ස්ථිර වශයෙන් කිව නොහැකි ය. එය දැන්වීම සඳහා නබි සල්ලල්ලාහු අලයිහි වසල්ලම් තුමා පැමිණි විට, පුද්ගලයෝ දෙදෙනෙක් අඬදබර කර ගනිමින් සිටියහ. එහෙයින් එය නබි තුමාට අමතක කරවන ලදී. ඒ නිසා, මෙය ඔබට යහපතක් ම වනු ඇත. එම නිසා රාමළාන් මාසයේ 29, 27,25,23,21 යන ඔත්තේ රාත්‍රියක දී සොයන්න (බුහාරි) යැයි නබි සල්ලල්ලාහු අලයිහි වසල්ලම් තුමා පවසා ඇත. රාමළාන් මාසයේ අවසාන රාත්‍රි 10යේ එනම් ඔත්තේ දිනවල (21, 23,25,27,29) රාත්‍රි හෝ රාමළාන් මාසයේ කිසි යම් රාත්‍රියක් යන විවිධ අදහස් ද ඇත. එම නිසා රාමළාන් මාසය පුරා ම එය බලාපොරොත්තුවෙන් ක්‍රියා කිරීම ඥානාන්විතය.

"කවරකු උතුම් වූ එම රාත්‍රිය - විශ්වාසයෙන් හා බලාපොරොත්තුවෙන් නැමදුම් හා වත්පිළිවෙත් කරමින් ගත කළේ ද ඔහුගේ පෙර හා පසු පව් යන සියල්ල කමාකෙරෙන්නේ ය." (බුහාරි) යැයි නබිතුමා පැවසීය. "අල්ලාහ්ගේ දූතයාණෙනි, මම ලයිලතුල් කද්ර් රාත්‍රිය ලැබුවේ නම් කුමක් කළ යුතු දැයි අයකු ඇසූ විට. اللّٰهُمَّ إِنَّكَ عَفُوٌّ تُحِبُّ الْعَفْوَ فَاعْفُ عَنِّي "දෙවියනි, ඔබ සමාව දෙන්නා ය. සමාව යදින්නන්ට කැමැත්තේ ය. එම නිසා මගේ පව්වලට සමාවන්න."(තිර්මිදි - අහමද්) යැයි පවසන ලෙස පිළිතුරු දුන්හ.

එපමණක් නොව රාමළානයේ අවසාන දින දහය ළඟා වූ විට නබි සල්ලල්ලාහු අලයිහි වසල්ලම් තුමා ලෞකික කටයුතුවලින් බැහැර ව රාත්‍රී කාලය සලාතය වැනි යහ නැමදුම මගින් ගෙවයි. තම පවුලේ අය ද ඒවා කෙරෙහි පොළඹවති.

'ලයිල්' යනු රාත්‍රිය යන අර්ථය ද 'කද්ර්' යන්න තීරණ කිරීම සැලසුම් කිරීම, මහන්තත්වය, ඉවසීම යන අදහස ද ගෙන දෙන්නේ ය. එම නිසා මෙම රාත්‍රියේ දී ජිබ්රීල් අලයිහි ස්සලාම් තුමා ද, අනෙකුත් මලක්වරු ද, අල්ලාහ්ගේ සැලැස්ම හා තීරණයට ද අනුකූල ව පොළොවට බසිති. "මින්කුල්ලි අම්රින්" යන සම්බන්ධය මෙය විදහා දක්වන්නේ ය. දෙව්ලොව හා මනුලොව අතර මලක්වරුන්ගේ සම්බන්ධය එම රාත්‍රිය පුරා උදෑසන වන තෙක් පවතින්නේ ය.

මෙම රාත්‍රිය මාස දහසකට වඩා උතුම් ය යන්නෙහි අදහස මෙම රාත්‍රියේ කරන යහක්‍රියා මාස 1000ක් මුළුල්ලේ කළ යහ ක්‍රියාවනට සමාන වන බවය. සමහර මුෆස්සිරීන්වරුන්ගේ අදහස අනුව මාස 1000ක් යනු සංඛ්‍යාවක් නොව අතිවිශාල යන අදහස ප්‍රකාශ කරන්නකි.

එහෙයින් මෙම සූරාව නිසි පරිදි පාරායනය කර එයින් අවධාරණය කරන අදහස විශ්වාස කර ක්‍රියා කරමු.

## අභ්‍යාසය

1. කෙටි පිළිතුරු සපයන්න

අ. අල්කුර්ආනය පහළ කළ රාත්‍රිය හඳුන්වන්නේ කෙසේ ද?

ආ. එම රාත්‍රිය කොපමණ කාලයකට සමාන වේද?

ඇ. ලයිලතුල් කද්ර් යන රාත්‍රිය බලාපොරොත්තු වන්නේ කවර දිනවල ද?

ඉ. ලයිලතුල් කද්ර් හි පාරායනයට නිර්දේශ කළ දුආව ලියන්න.

ඊ. එම රාත්‍රියේ දී අපට කළ හැකි යහක්‍රියා කිහිපයක් සඳහන් කරන්න.

2. පහත අරාබි වැකිවල තේරුම ලියන්න.

لَيْلَةِ الْقَدْرِ

اَلْفِ شَهْرٍ

حَتّٰى مَطْلَعِ الْفَجْرِ

## ක්‍රියාකාරකම්

සූරතුල් කද්රය නියමාකාරයෙන් පරායනා කර පෙන්වන්න.